KALĀ
COMMUNE

## KALĀ Commune

**(කලා කමියුනය)**

**අභිරක්ෂණය : මන්දිරා රණතුංග**

10 පෙබරවාරි - 10 පෙබරවාරි 2025

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 75 වන සංවත්සරය සමරමින්, *KALĀ Commune* නේවාසික වැඩසටහන ගවේෂණය, නිර්මාණය සහ  එකිනෙකා සමඟ සම්බන්ධ වීම සඳහා දකුණු ආසියාව පුරා සිටින කලාකරුවන් හත් දෙනෙකු එකතු කරයි. මෙම වැඩසටහන මගින් සංස්කෘතික හුවමාරුව හරහා සහයෝගී අත්දැකීම් සහ අධ්‍යයනයේ ශක්‍යතා ඉස්මතු කරන අතර, එම කලාකරුවන්ට ශිල්ප ක්‍රම බෙදා ගැනීමටත්, තම භාවිතාවන් ඔප්නංවා ගැනීමටත්, එකිනෙකා ප්‍රබෝධවත් කිරීමටත් ඇරයුම් කරයි. එක්ව ගත් විට, මෙම කලාකරුවන්ගේ කෘති අනන්‍යතාව, සමාජ විපර්යාස, සංස්කෘතික උරුමය, ග්‍රාමීය ජීවිතය සහ පාරිසරික ගැටලු, සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම සමකාලීන ප්‍රවේශයන් සමඟ සංකලනය කිරීම වැනි තේමා ආමන්ත්‍රණය කරයි.

**මෙම ප්‍රදර්ශනය තුළින් ඔවුන්ගේ නිර්මාණ අප වෙත ඉදිරිපත් කෙරෙනවා පමණක් නොව, නිර්මාණාත්මක චින්තනය හැඩගැස්වීමේ දී සහ කලාශිල්ප ප්‍රගමනය කිරීමේ දී කලාත්මක භාවිතයේ වැදගත්කම ද අගයනු ලැබේ.**

*KALĀ Commune* නේවාසික වැඩසටහන දකුණු ආසියාවේ කලාත්මක උරුමයේ සහ සමකාලීන අත්හදා බැලීම්වල සාරය මූර්තිමත් කරන අතර, එකිනෙකා සමඟ සම්බන්ධ වීම, නිර්මාණාවේශය ලබා දීම සහ රූපාන්තරණය **වීම සඳහා එක්ව වැඩ කිරීමෙහි ඇති බලය සමරයි.**

KALĀ
COMMUNE

**සීමා ශර්මා ශා** (උ. 1966, වරනාසි, ඉන්දියාව; නේපාලයේ කත්මන්ඩු නුවර වෙසෙමින් වැඩ කරයි) බෞද්ධ දර්ශනය, පුරාණෝක්ති සහ ස්වාභාවික පරිසරය මූලාශ්‍ර කරගනිමින් නිර්මාණකරණයේ යෙදෙන කීර්තිමත් මුද්‍රණ ශිල්පිනියකි. ඇගේ භාවිතය මුද්‍රණ ශිල්ප ක්‍රම, විශේෂයෙන් නිරේඛනය, සමග ආධ්‍යාත්මික තේමාවන් සංකීර්ණ ලෙස ඒකාබද්ධ කරමින්, සතිය, අනිත්‍යතාව සහ සම්බෝධිය ගවේෂණය කරයි. සියුම් ඉන්ටැග්ලියෝ මුද්‍රණ ක්‍රියාවලියක් වන නිරේඛනය යනු, ඉටි ගැල්වූ ලෝහ තහඩුවක් මත රටාවක් කපමින් සිදු කෙරෙන සූක්ෂ්ම ඉන්ටාග්ලියෝ මුද්‍රණ ක්‍රියාවලියකි. එහි දී තහඩුව අම්ලයක් තුළ බහාලන අතර අම්ලයට නිරාවරණය වූ කොටස් බාදනයට ලක් වී, මුද්‍රණය සඳහා තීන්ත රැඳෙන කලාප නිර්මාණය වේ. මෙම තාක්ෂණය ශාට ඉසියුම් වයනයන් *(textures)* හා සූක්ෂ්ම විස්තර ඉදිරිපත් කිරීමේ ඉඩ සලසමින් ඇගේ ආධ්‍යාත්මික ආඛ්‍යානවලට ගැඹුරක් එක් කරයි. ශාගේ කෘතිවලට සැලකිය යුතු ආභාසයක් දනවා ඇත්තේ ශාක්‍ය ප්‍රජාවෙන් තෝරාගනු ලැබ දිව්‍යමය ලෙස ගෞරවයට පාත්‍ර වන නේපාලයේ ජීවමාන දේවතාව වන කුමාරිගේ කතාව යි. අභිවාදනයට පාත්‍ර වන කුමාරි හුදකලාවේ ජීවත් වන අතර, ආධ්‍යාත්මික මහිමාව සහ ගැඹුරු හුදකලාව යන දෙක ම මූර්තිමත් කරයි. ශාගේ කෘති මාලාව දිව්‍යමය ගෞරවයට ආවේණික වූ හුදෙකලාව සහ පරිත්‍යාගය යන මේ ද්විත්ව පැවැත්ම ගවේෂණය කරයි. ඇගේ මුද්‍රිත කෘති මෘදු නිල් සහ කොළ වැනි ශාන්ත වර්ණ ඔස්සේ ධ්‍යානමය නිශ්චලතාවක් පුබුදුවමින්, ආධ්‍යාත්මික චාරිකා සහ සංස්කෘතික සම්ප්‍රදායන් පිටුපස සැඟවුණු අරගල සැලකිල්ලට භාජනය කරන මෙන් නරඹන්නන්ට ආරාධනා කරයි. ශාගේ කෘති අධ්‍යාත්මික භාවිතාවන්හි චිත්තවේගී සංකීර්ණතා හෙළි කරමින් මුද්‍රණකරණයේ සුනිශ්චිතභාවය මානව හා දිව්‍යමය අත්දැකීම් පිළිබඳ ඇගේ අභ්‍යන්තර ගවේෂණය සමඟ මුසු කරයි.

KALĀ
COMMUNE

**චන්ද්‍රා භට්ටාචාර්ජි** (උ. 1961, කල්කටා, ඉන්දියාව; කල්කටාවේ වෙසෙමින් වැඩ කරයි) යනු ස්වභාවධර්මය සමඟ සිය සම්බන්ධතාව සහ මිනිසුන්, සතුන් සහ ස්වාභාවික ලෝකයේ සහජීවනය පිළිබඳ විශ්වාසය තුළ ගැඹුරින් මුල්බැස කටයුතු කරන සමකාලීන කලාකරුවෙකි. සොබාදහම් චිත්‍ර කෙරෙහි ඔහුගේ ළමා කාලය තුළ ඇති වූ උනන්දුව සහ ඔහුගේ ශාස්ත්‍රාලීය පසුබිමේ බලපෑම අනුව, භට්ටාචාර්ජිගේ කලා භාවිතය ජීවිතය සහ පරිසරය අතර ඇති අන්තර් සම්බන්ධතාව පිළිබඳ සාකච්ඡා කරයි. ඔහුගේ කලාව තමන් වටා පවත්නා ලෝකය පිළිබඳ ඔහුගේ නිරීක්ෂණ පිළිබිඹු කරන අතර, ග්‍රාමීය භූදර්ශන සහ මානවයා සහ ඒවායේ වාසය කරන ජීවීන් අතර සබඳතා මත පදනම් වේ. වර්ණ භාවිතය සම්බන්ධයෙන් භට්ටාචාර්ජිගේ අවමතාවාදී ප්‍රවේශය, සංයමයෙන් යුතු තානයන් යොදාගන්නා නමුත් ගැඹුරු පොහොසත්බවක් ප්‍රකාශයට පත් කරන කලාවක් හිමි සන්තාල් ගෝත්‍රය සමඟ ඔහුට ඇති සබඳතාව තුළින් පෝෂණය වේ. විශේෂයෙන් ඔහුගේ මුල්කාලීන කෘතිවල භෞමික වර්ණ වෙත යොමු වීමෙන් සහ වඩාත් මෑතකාලීන කෘතිවල කළු සහ සුදු වර්ණ භාවිතය මඟින් හෙතෙම තම කලාවට ශාන්ත හැඟීමක්, කුලුපග බවක් සහ ස්වාභාවික ලෝකය කෙරේ ගෞරවපූර්වක බවක් කාවද්දයි. කලාකරුවා විවිධ මාධ්‍යයන් සමඟ වෙන වෙනම වැඩ කරන අතර, භාවිත කරන ද්‍රව්‍ය නොසලකා, එක් එක් කෘතිය සුසංවාදය නිර්මාණය කිරීම තුළින් ඔහු තම කලාත්මක අනන්‍යතාව රැකගනී. මෘදු, භෞමික වර්ණ භාවිතය ඔස්සේ වේවා නැතහොත් කළු සහ සුදු වර්ණ අතර තියුණු විලක්ෂණය මගින් වේවා විවිධාකාර ශිල්පක්‍රම රාශියක් තුළ තමන්ට ම විශේෂිත හඬක් පවත්වාගෙන යාමට ඔහු සමත් වෙයි. එම භාවිතයෙන් චිත්තවේගී ගැඹුර සහ සංකීර්ණත්වය ප්‍රකාශ කිරීමේලා ඔහු සතු ප්‍රවීණත්වය ප්‍රකට වේ.  ඔහුගේ කලාව මානව පැවැත්ම, සොබාදහම සහ සතුන් අතර සහජීවන සම්බන්ධතාව පිළිබඳ මෙනෙහි කරන මෙන් නරඹන්නන්ට ආරාධනා කරන අතර, මෙම බලවේග එකිනෙකා හැඩගස්වන ආකාරය පිළිබඳ ප්‍රබල විවරණයක් ඉදිරිපත් කරයි.

**පංකජ් පන්වාර්** (උ. 1961, ලක්නව්, ඉන්දියාව; ශාන්ති නිකේතන් බෝල්පූර් හි වෙසෙමින් වැඩ කරයි) අමුද්‍රව්‍ය හා ආකෘති පිළිබඳ නවෝත්පාදක ගවේෂණ සම්බන්ධයෙන් ප්‍රසිද්ධිය උසුලන මූර්ති ශිල්පියෙකි. ශාන්තිනිකේතනයේ විශ්ව-භාරතී විශ්වවිද්‍යාලයෙහි ද, ලන්ඩනයේ රෝයල් කොලෙජ් ඔෆ් ආර්ට් හි ද උපාධිධාරියකු වන පන්වාර්ගේ භාවිතය මඟපෙන්වීම ලබන්නේ දෘඪතර ශික්ෂණවේදී පදනමකින් හා අත්හදාබැලීම් කෙරේ වූ කැපවීමකිනි. ශාන්තිනිකේතනයේ ආරම්භක රබීන්ද්‍රනාත් තාගෝර්ගේ සහ පුරෝගාමී මූර්ති ශිල්පී රම්කින්කර් බායිජ්ගේ ඉගැන්වීම්වල ආභාසය ලද පන්වාර්, බායිජ්ගේ ගතික දළසටහන් හා චලනය කෙරේ දක්වන අවධාරණය වෙතින් නිර්මාණාවේශය ලබයි. සුශෙන් සෝෂ්ගේ මඟපෙන්වීම යටතේ ඔහු ජ්‍යාමිතික හැඩතල හා ව්‍යුහගත රූප භාවිතය හඳුනාගත් අතර, කේ. ජී. සුබ්‍රමන්යන් වියුක්ත හැඩතල වෙත ප්‍රවේශ වන අන්දම ඔහුගේ සෞන්දර්ය සංවේදීතාව වැඩිදුරටත් පොහොසත් කළේ ය. මේ ආභාසයන් හා ඒකාබද්ධ වන ඔහුගේ අධ්‍යාපනයේ ඌරුව, සාම්ප්‍රදායිකත්වය හා නූතනත්වය යා කරන පන්වාර්ගේ විශේෂිත ශෛලියට පදනම දමා තිබේ. බරෝඩා හි රාඝව් කනේරියා හා සොම්නාත් හෝරේ වැනි මහාචාර්යවරුන් යටතේ ද ලන්ඩනයේ බ්‍රයන් නේල් හා එඩුවාඩෝ පාඔලොසි වැනි මහාචාර්යවරුන් යටතේ ද වැඩිදුර අධ්‍යාපනය ලබද්දී පන්වාර් අමුද්‍රව්‍ය හැසිරවීම හා අවකාශීය ගවේෂණය පිළිබඳ විශේෂ ප්‍රාගුණ්‍යය මුවහත් කරගත්තේ ය. ලෝහ, පාෂාණ, දැව හා අධිගත වස්තූන් සමඟ ඔහු අඛණ්ඩව ගෙනගිය ගතික ගනුදෙනුව ඔහුට අනන්‍යතාව, මතකය හා සමාජ-දේශපාලන ආඛ්‍යානයන් විමර්ශනය කරන මූර්ති ඉදිකිරීමේ හැකියාව ලබාදුන්නේ ය. ජාතික හා ජාත්‍යන්තර තලයේ ප්‍රදර්ශනය කෙරුණු පන්වාර්ගේ කෘති, අවකාශීය සම්බන්ධතා හා සංස්කෘතික සන්දර්භ යළි පරිකල්පනය කරන අතර සමකාලීන මූර්ති කලාවේ ප්‍රමුඛ චරිතයක් ලෙස ඔහු ස්ථානගත කරයි. අනේකවිධ ආභාසයන්ගේ නිරුත්සාහික සංකලනයක් ප්‍රකට කරන ඔහුගේ භාවිතය, අන්තර්ශික්ෂණාත්මක උගැන්ම හා නවෝත්පාදනය තුළ මුල් බැස පවතින අතර මූර්ති කලාවේ සීමාමායිම් පුළුල් කරයි.

KALĀ
COMMUNE

**හේමා ශිරෝනි** (උ. 1991, මහනුවර, ශ්‍රී ලංකාව; කොළඹ වෙසෙමින් වැඩ කරයි) බහුශික්ෂණාත්මක කලාකාරියකි. ඇගේ කෘති තුළ යොදාගැනෙන අමුද්‍රව්‍ය අනන්‍යතාව, මතකය හා අයත් වීම පිළිබඳ ප්‍රස්තර ආඛ්‍යාන බවට රූපාන්තරණය වෙයි. එම්බ්‍රොයිඩර්, මැහුම්, එකලස්කරණය හා සාම්ප්‍රදායික නොවන අමුද්‍රව්‍ය භාවිතය ඔස්සේ ශිරෝනි සංක්‍රමණයේ හා අවතැන්වීමේ සංකීර්ණතා පිළිබිඹු කරන ස්පර්ශාත්මක ප්‍රකාශන නිර්මාණය කරන්නී ය. ශ්‍රී ලංකාවේ යටත් විජිත ඉතිහාසය, සිවිල් යුද්ධය හා ඇගේ ම ළමා වියෙහි අනිත්‍ය ස්වභාවය කෙරෙන් ගැඹුරින් ආභාසය ලබන ඇගේ භාවිතය, පුද්ගලික කතාන්දර පුළුල් සංස්කෘතික හා ඓතිහාසික සන්දර්භ සමඟ එකට වියයි. ශිරෝනිගේ කලාව සාම්ප්‍රදායික භාවිතයන් උකහාගෙන ඒවාට සමකාලීන අර්ථ කාවද්දමින්, කලාශිල්ප හා ලලිත කලාව අතර පවතින ගතානුගතික සීමාවලට අභියෝග කරයි. ඡායාරූප මත මැහුම් යොදාගැනීම නිසා ඇගේ කෘතිවලට පෞද්ගලික, කුලුපග බවක් එක් වෙයි; මතකය සමඟ ද්‍රව්‍යාත්මක බව වෙලීගනියි; එම කෘතිවල ප්‍රබෝධක ගුණය ඉහළ යයි. ශිරෝමි එම්බ්‍රොයිඩර් වැඩට අමතරව අණ්ඩ දැමීම හා කැපී ඉවත් වන රෙදි කැබලි යොදාගන්නේ, ඉවත ලන අමුද්‍රව්‍ය වශීකාරක සංරචනා හැටියට යළි පරිකල්පනය කරමිනි. සෑම කොටසක් ම කැබලි වුණු ඉතිහාසයන්, මතකයන් හා අනන්‍යතාවන් පිළිබඳ රූපක බවට පත් වී නව ආකෘති තුළ යළි එකලස් වෙයි. මේ ශිල්පක්‍රම, අඛණ්ඩව වෙනස් වන ලෝකයක් තුළ අනන්‍යතාව සතු ප්‍රත්‍යාස්ථිතිය හා අනුවර්තනතාව සංකේතවත් කරයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස බිහි වන කෘති වයනය අතින් පොහොසත් ය; දෘශ්‍යමය වශයෙන් සිත් පැහැරගනී; පිළිසඳරක යෙදෙන මෙන් නරඹන්නාට ඇරයුම් කරයි. ශිරෝමිගේ පුරාණෝක්තිගත සංකල්පරූප හා මිශ්‍ර අමුද්‍රව්‍ය භාවිතය ද සමාජ ලිංගිකත්වය හා සංස්කෘතික දෙමුහුන් භාවය පිළිබඳ ගවේෂණය ද ප්‍රජාවක ස්වභාවය නිර්ණය කරන සියුම් සබඳතා ඉස්මතු කොට දක්වයි. ඉතිහාසය හා පෞද්ගලික අනුභූතීන් යන දෙක ම පුද්ගලයින් හා වස්තූන් තුළට කාවැදී පවත්නා අන්දම පරීක්ෂා කරමින් ඇය දේශ සීමා ඉක්මවා යන කලාවක් නිර්මාණය කරන්නී ය.

**රිනෝෂන් සුසිමන්** (උ. 1993, මඩකලපුව, ශ්‍රී ලංකාව; යාපනයේ වෙසෙමින් වැඩ කරයි) අන්තර්ශික්ෂණාත්මක කලාකරුවෙකි. ඔහුගේ කෘති පුද්ගලික ආඛ්‍යාන සමාජ පරිවර්තනයන් සමඟ යා කරයි. සුසිමන්ගේ භාවිතය, අවිඤ්ඤාණික ශාරීරික චලන කෙරෙහි විශේෂ අවධානයක් සහිතව, මනුෂ්‍ය ශරීරය හා මානව රූපය වටා භ්‍රමණය වෙයි. මෙකී තේමාවන් පිළිබඳ ඔහුගේ ගවේෂණය විවිධ වූ සමාජ ගැටලු ආමන්ත්‍රණය කිරීමේ ඉඩ සලසා ඇති අතර මේ සංකල්ප ප්‍රකාශයට පත් කිරීම සඳහා ඔහු ප්‍රධාන වශයෙන් වැඩ කරන්නේ ඩිජිටල් මාධ්‍ය සමඟිනි. අනන්‍යතාව, මතකය හා අයත් වීම පිළිබඳ රූපක ලෙස දෛනික ජීවිතයට අයත් වස්තූන්, විශේෂයෙන් ඇඳ ඇතිරිලි යොදාගන්නා සුසිමන් ඩිජිටල් හා සාම්ප්‍රදායික මාධ්‍ය දෙවර්ගය ම භාවිතයට ගනී. අවිඤ්ඤාණික චලනවල හා ක්ෂණභංගුර අත්දැකීම්වල සලකුණු හසු කරගනිමින් සිය ඇඳ ඇතිරිලි දිනපතා ප්‍රලේඛනගත කිරීම සුසිමන්ගේ භාවිතයෙහි කේන්ද්‍රීය අංගයකි. සුසිමන් සිය නිර්මාණාත්මක ක්‍රියාවලියෙහි අවශ්‍ය අංගයක් ලෙස නව මාධ්‍ය හා තාක්ෂණය යොදාගනිමින් මේ වාර්තා ඩිජිටල් කෘති බවට රූපාන්තරණය කරයි. සිය ලැප්ටොප් පරිගණකය තමන්ගේ ශාලිකාව ලෙස විස්තර කරන ඔහු, පුද්ගලික හා සමාජීය භූදර්ශන යළි පරිකල්පනය කරන්නා වූ භූලක්ෂණ පිළිබඳ භාෂාවක් යොදාගනිමින් වියුක්ත අනුරූපණ නිර්මාණය කිරීම සඳහා එම ප්‍රලේඛනගත රූප හසුරුවයි. ඔහුගේ කෘති සමාජමය සම්මතයන් ප්‍රශ්න කරයි; නිරන්තරයෙන් වෙනස් වන ලෝකයක් තුළ ස්ථාවරත්වයෙහි සහ අනන්‍යතාවෙහි ඇති ගලා යනසුලු, අස්ථිර ස්වභාවය ඉස්මතු කරයි. ඒකාකාරී දෙය ගැඹුරු සංස්කෘතික හා චිත්තවේගී විමර්ශන බවට ඔසවා තැබීම මඟින් සුසිමන්ගේ කලාව පුද්ගලික ඉතිහාසය හා සාමූහික මතකයෙහි අන්තර්ඡේදනයන් පිළිබඳ නැවත සිතාබලන මෙන් නරඹන්නාට අභියෝග කරයි.

# KALĀ COMMUNE

**අහ්මඩ් ජාවෙඩ්** (උ. 1992, ලාහෝර්, පාකිස්තානය; ලාහෝරයේ වෙසෙමින් වැඩ කරයි) සාම්ප්‍රදායික ශිල්පක්‍රම සමකාලීන විධික්‍රම සමඟ නවෝත්පාදක අන්දමින් සංකලනය කිරීම සම්බන්ධයෙන් පැසසුම් ලබන සමකාලීන කලාකරුවෙකි. ඔහුගේ භාවිතය කලාකරුවාගේ ශාලිකාව තුළ සිදු වන ගතික ක්‍රියාකාරකම්වල නිමේෂයන් ඡායාරූපයට හසු කරගනිමින් ප්‍රලේඛනය කිරීම වටා කේන්ද්‍රගත ව තිබේ. මෙම රූප ඉන් පසු ඔහුගේ නිර්මාණාත්මක ක්‍රියාවලියෙහි පදනමක් බවට පත් වේ. එහි දී ඔහු යථාර්ථය හා කලාත්මක අර්ථකථනය අතර පවත්නා ගතික සීමා ගවේෂණය කරන නැවුම් දෘශ්‍ය ආඛ්‍යාන නිමැවීම සඳහා ඒවායේ මිනුම් ප්‍රමාණ, සන්දර්භ හා අන්තර්ගත මූලිකාංග වෙනස් කරයි. ලාහෝරයේ ජාතික කලා විද්‍යාලයේ (National College of Arts - NCA) ගෞරව උපාධිධාරියකු වන ජාවෙඩ් සිය අධ්‍යයන ආයතනයේ පොහොසත් උරුමයෙන් නිර්මාණාවේශය ලබයි. NCA ආයතනය නවීන ශිල්පක්‍රම හා ආඛ්‍යානමය විභවයන් ඔස්සේ නවෝත්පාදනය පෝෂණය කරන අතර ම මුගල් හා රාජ්පුට් ක්ෂුද්‍ර චිත්‍ර සම්ප්‍රදායන් සංරක්ෂණය සම්බන්ධයෙන් කීර්තිය හිමි කරගෙන තිබේ. උරුමය හා අත්හදාබැලීම් සමඟ බැඳුණු ද්විත්ව අවධාරණය, සම්භාව්‍ය ක්‍රමවේදයන් සමකාලීන රාමුවක් තුළ යළි අර්ථකථනය කිරීමේ හැකියාව ලබා දෙමින් ජාවෙඩ්ගේ කලාත්මක දැක්ම ගැඹුරින් හැඩගස්වා තිබේ. ජාවෙඩ්ගේ, කෘති ක්ෂුද්‍ර චිත්‍ර කලාවෙහි ප්‍රධාන ලක්ෂණයක් වන සියුම් විස්තර (detail) කෙරෙහි දක්වන අවධානය පිළිබිඹු කරයි. සුනිශ්චිත භාවය හා උද්දීප්ත විසංසන්දනයන්ගෙන් සංලක්ෂිත වූ *බද්රංග්* නමැති මුගල් කලා ශිල්පක්‍රමයේ ආභාසය ඔහුට විශේෂයෙන් ලැබී තිබේ. සැබෑ ජීවිතයේ සිදුවීම් හා රාජසභා ජීවිතය ප්‍රලේඛනය සඳහා ඓතිහාසිකව යොදාගැනුණු මේ ශිල්පක්‍රමය, සෑම විස්තරයක් ම ප්‍රවේසමෙන් සැලකිල්ලට ගනිමින් සාම්ප්‍රදායික ක්ෂුද්‍ර චිත්‍රවල සුනිශ්චිත බව අනුගමනය කරමින් කලා ශාලිකාවේ විවිධ නිමේෂයන් ප්‍රලේඛනයේ දී ජාවෙඩ්ගේ ප්‍රවේශයට මඟ පෙන්වයි. ප්‍රලේඛනයෙන් ඔබ්බට යන හෙතෙම සිය ඡායාරූපවල අන්තර්ගත අංග විකරණය කරමින්, සැබෑ ජීවිතයේ දර්ශන ප්‍රකාශනාත්මක දෘශ්‍ය ආඛ්‍යාන බවට පරිවර්තනය කරමින් මේ නිමේෂයන් යළි අර්ථකථනය කරයි. සාම්ප්‍රදායික *බද්රංග්* ශිල්පක්‍රමය සමකාලීන ඡායාරූප කලාව සමඟ මුසු කිරීමේ දී ජාවෙඩ් කලාව හා ඉතිහාසය යන දෙක ම හැඩගැස්වීමෙහිලා ප්‍රලේඛනය සතු පරිණාමය වන භූමිකාව පිළිබඳ මෙනෙහි කරන මෙන් නරඹන්නන්ට ඇරයුම් කරන කෘති නිර්මාණය කරයි.

**KALĀ**
COMMUNE

**අහමඩ් රසෙල්** (උ. 1988, බරිෂාල්, බංගලාදේශය; ඩකාහි ජීවත් වෙමින් වැඩ කරයි) ඡායාරූප ශිල්පියෙකි. ඔහුගේ සාහිත්‍ය පසුබිම සහ බංගලාදේශයේ සමාජ-දේශපාලන වටපිටාව ග්‍රහණය කර ගැනීම කෙරෙහි ඔහු දක්වන අවධානය වෙතින් ඔහුගේ කෘති ගැඹුරු ආභාසයක් ලබයි. ඔහුගේ භාවිතය නාගරීකරණය, දේශගුණික විපර්යාස, පාරිසරික අභියෝග සහ ඓතිහාසික මතකය වැනි තේමාවන් ගවේෂණය කරන අතර, රටේ පරිණාමය වන අනන්‍යතාවය පිළිබඳ ගැඹුරු දෘශ්‍ය ආඛ්‍යානයක් සම්පාදනය කරයි. බංග්ලාදේශ සාහිත්‍යය තුළ රසෙල්ට ඇති පසුබිම ඔහුගේ කෘති පුරා අනුනාද නංවන කාව්‍යමය සෞන්දර්යයකින් ඔහුගේ ඡායාරූපකරණය පුරවයි. ඔහුගේ ව්‍යාපෘති බොහෝ විට පෘථුල පර්යේෂණ, ස්ථාන නැරඹීමට යාම සහ සංචාරවලින් සමන්විත ක්‍රියාවලියක් හරහා පරිණාමය වන අතර, ඒවායෙහි දී ඔහු තමන් ග්‍රහණය කර ගැනීමට ප්‍රයත්න දරන ගැටලු තුළ ගැඹුරින් නිමග්න වෙයි. රසෙල් සිය කාචය හරහා රූපයක් රාමු කිරීමට පෙර, තම වස්තු විෂය අවබෝධ කරගනිමින් ඒ සමග ගනුදෙනු කිරීමට සැලකිය යුතු කාලයක් කැප කරයි. ඔහුගේ කලාත්මක දර්ශනය කේන්ද්‍රගත වන්නේ කෘත්‍රිම විසිතුරුවලින් තොරව ජීවිතය අව්‍යාජ ලෙස ඉදිරිපත් කිරීම කෙරෙහි ය. රසෙල් ස්වභාවික ආලෝකයට ප්‍රමුඛත්වය දෙමින්, දිනයේ ඒ ඒ වේලාවට තම රූපවල ස්වභාවය හැඩගැස්වීමට අවකාශ සලසයි. "රාත්‍රියට අයත්" යන අර්ථය ඇති *නොක්ටර්න්ස්* යන ලතින් වචනයෙන් හඳුන්වනු ලැබූ ඔහුගේ කෘති මාලාවේ, ඔහු බංගලාදේශයේ ගඩොල් නිෂ්පාදනය වැනි කර්මාන්තවල යථාර්ථය ග්‍රහණය කරයි. කෘත්‍රිම ආලෝකකරණය අවම වශයෙන් භාවිත කිරීමෙන් සහ කෘත්‍රිම සැකසුම් සහ ඩිජිටල් තාක්ෂණයේ ආධාරයෙන් තොරව වැඩ කිරීමෙන්, රසල් තම රූප වඩාත් නිර්ව්‍යාජ ස්වරූපයෙන්, ආලෝකයේ සහ සෙවනැල්ලේ ස්වාභාවික අන්තර්-ක්‍රියා අවධාරණය කරන බවට සහතික කරගනී. ඔහුගේ කෘති තුළ, බංගලාදේශයේ වායු දූෂණයේ ප්‍රධාන ප්‍රභවයක් වන ගඩොල් කර්මාන්තයේ අළු පැහැ දුම, පාරිසරික පරිහානිය පිළිබඳ ප්‍රබල සංකේතයක් බවට පත්වේ. රසෙල් එය පවතින තත්වයෙන් ම ග්‍රහණය කරගැනීමෙන්, කාර්මික භූදර්ශනයේ අරගල පිළිබිඹු කරමින් නාගරික පරිසර දූෂණය පිළිබඳ හදිසි ගැටලු ඉස්මතු කරයි. සූක්ෂම ප්‍රවේශයක් හරහා, රසල්ගේ ඡායාරූපකරණය සාම්ප්‍රදායික සීමාවන් ඉක්මවා යන අතර, සමකාලීන බංගලාදේශය හැඩගස්වන සමාජ-දේශපාලනික සහ පාරිසරික යථාර්ථයන්ට මුහුණ දෙන මෙන් නරඹන්නන්ට අභියෝග කරයි.